සැ. යු. - 2021.07.16 දින අංක 2,237 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV(ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,238 - 2021 ජූලි මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2021.07.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1024 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1029 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1042 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අගෝස්තු මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූලි මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1023- B 82252 — 5,403 (2021/07)

# තනතුරු - ඇබෑර්තු

## මදුරාවල ප්‍රාදේශීය සභාව

(බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවය)

මදුරාවල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

1. සෞඛ්‍ය පරිපාලක - (111 වන ශ්‍රේණිය)

(බඳවා ගැනීම් පටිපාටිය - 2014.02.25 වැනි දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන-ඛණ්ඩ 2 සේවා ගණයේ පරිපාලක තනතුරු සඳහා වන බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය)

පුරප්පාඩු ගණන - 01

වැටුප් පරිමාණය - MN-1-2016 (රා.ප.ච. 3/2016 අනුව)
රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 27,140)
(හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

(*අ*) i අධ්‍යාපන සුදුසුකම් (විවෘත අයදුම්කරුවන් සඳහා)

* භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (6) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

* අධ්‍යපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

ii. අධ්‍යාපන සුදුසුකම් (සීමිත අයදුම්කරුවන් සඳහා)

* අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයන් 05ක් එකවර සමත්වී තිබිය යුතුයි.)

(*ආ*) පළපුරුද්ද (සීමිත අයදුම්කරුවන් සඳහා පමණි.)

* පළාත් පාලන ආයතනයක PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහක් (5) සපුරා ඇති සේවකයන් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය.

(*ඇ*) වෙනත් සුදුසුකම් (සීමිත හා විවෘත අයදුම්කරුවන් සඳහා)

* වයස : (විවෘත අයදුම්කරුවන් සඳහා)
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුත අතර අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

(සීමිත අයදුම්කරුවන් සඳහා)
දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියතු වුවන්ට මෙම වයස් සීමාවන් අදාළ නොවේ.

* මෙම දැන්වීමේ පහතින් බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි යටතේ දක්වා ඇති 1 සිට 111 දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(*ඇ*) ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

ලිඛිත පරීක්ෂණයේ සංයුතිය (විවෘත අයදුම්කරුවන් සඳහා)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳව සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

***සටහන*** : ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩුව පුරවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයේ සංයුතිය (සීමිත අයදුම්කරුවන් සඳහා)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය | 100 | 40% |

***සටහන*** : ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

(*ඉ*) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (සීමිත අයදුම්කරුවන් සඳහා පමණි).

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය | 15 | |
| වැඩ බැලීම හෝ රාජකාරි ඉටු කිරීම | 10 | 25 |
| ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම | 20 | |
| පෞරුෂත්වය | 05 | |

***සටහන*** : සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සලකා බලනු ලැබේ.

සැ.යු.- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්කරුවන් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

02. **බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :**

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතුය. (මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)

iii. යහපත් චරිතයකින් හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iv. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදළ පරීක්ෂණවල දී කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන්ද යන්න මදුරාවල ප්‍රාදේශීය සභාවේ ලේකම් තීරණය කරනු ලබන ආකාරයට විය යුතුය.

v. කිසියම් අයදුම්කරුවෙකු බඳවා ගැනීමේ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ එම පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසලකනු ලැබේ.

03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.

ii. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

iii. බඳවාගනු ලබන තැනැත්තන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

(දැනටමත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නියුතු පත්වීම ස්ථිර කරන ලද සේවකයින් වසර 01ක වැඩ බැලීමේ කාලයකට යටත් කරනු ලැබේ.)

iv. මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති, බස්නාහිර පළාත් මූල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් හා බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ මදුරාවල ප්‍රාදේශීය සභා ලේකම් විසින් කලින් කලට පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

04. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

i. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘති අනුව, අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත්කළ යුතුය.

ii. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර "ආ" සිට "උ" දක්වා යන සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග එවිය යුතුය.

(අ) ඔබගේ නම සහ ලිපිනය ලියන ලද 9"X4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ;

(ආ) උප්පැන්න සහතිකය ;

(ඇ) අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන වෙනත් සහතික ;

(ඈ) වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික ;

(ඉ) පළපුරුද්ද පිළිබඳ සහතික ;

(ඊ) තනතුරට අදාළ වෙනත් සහතික ;

(උ) ජාතික හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ දෙපැත්තේ ඡායාස්ථිත පිටපත ;

(ඌ) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය (මෙම සහතිකය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස 06කට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතු අතර වසර 3ක ස්ථිර පදිංචිය සනාථ කිරීමේදී අවිනිශ්චිතව ලබා දී ඇති සනාථ කිරීම සළකා බලනු නොලැබේ. "උදා:- වසර 05ක සිට පදිංචිව සිටින බව පවසයි) ;

(එ) තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයට අදාළ පොලිස් ස්ථානයෙන් ලබා ගත් පොලිස් වාර්තාවක් (මෙය අයදුම්පත් භාර ගන්නා දිනට ඉහතින් වූ මාස 06කට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතුය.) ;

(ඒ) චරිත සහතිකයක්.

iii. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර **2021.08.30** වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, මදුරාවල ප්‍රාදේශීය සභාව" මදුරාවල, අගුරුවාතොට යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

iv. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

v. තැපෑලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. අදාළ බඳවා ගැනිම් පටිපාටිවලට අනුව මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් තෝරා ඔවුන් බඳවා ගැනීමේ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පතේ සාවද්‍ය තොරතුරු සඳහන් කර පරීක්ෂණ සඳහා සහභාගී වූ බවට අනාවරණය වුවහොත් එවැන්නන් අසාධූ ලේඛන ගත කිරීමට කටයුතු කරනු ලබන අතර එසේ වුවහොත් මින් ඉදිරියට මෙම සභාව සඳහා සිදු කරන කිසිදු සේවක බඳවා ගැනීමක් සඳහා අයදුම් කිරීමේ අවස්ථාව එවැනි අයදුම්කරුවන්ට අහිමි වනු ඇත.

අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ තනතුරු ප්‍රමාණය වෙනස් කිරීම හෝ බඳවා ගන්නා ප්‍රමාණය තීරණය කිරීමේ බලය මදුරාවල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලු කාරණා පිළිබඳ අවසාන තීරණය මදුරාවල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

පී. අනුලා ප්‍රසංගිකා,
ලේකම්,
මදුරාවල ප්‍රාදේශීය සභාව.

**මදුරාවල ප්‍රාදේශීය සභාව**

සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා අයදුම් පත්‍රය

1. ජීව දත්ත තොරතුරු :..........................................................................................

1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (උද-සිල්වා ඒ. බී. සී.)" ...........................................................................................

1.2 සම්පූර්ණ නම :..........................................................................................

1.3 ස්ථිර ලිපිනය :..........................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය :..............................

1.6 දුරකතන අංකය :..............................

1.7 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

1.8 2021.08.31 වැනි දිනට වයස : අවුරුදු :............ මාස :............ දින :............

2. අධ්‍යාපන සුදුසුකම් :

2.1 අ.පො.ස (සා.පෙළ) විභාගය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| i | | vi | |
| ii | | vii | |
| iii | | viii | |
| iv | | ix | |
| v | | x | |

2.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය ඃ

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| i | | | |
| ii | | | |
| iii | | | |
| iv | | | |

3. ඔබ දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් ද?

එසේ නම්,

3.1 ඔබ දැනට දරන තනතුර :..................
3.2 ස්ථිර පත්වීම් දිනය :..................
3.3 සේවය ස්ථිර කරන ලද දිනය :..................

4. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ඃ

4.1 ඔබ විසින් ඉල්ලුම් කරන ලද තනතුරට අදාළව වෘත්තීය පළපුරුද්දක් ලබා තිබේද ? :..................
4.2 එසේ නම් පුහුණුව ලැබූ ආයතනයේ නම :..................
4.3 පුහුණුව ලැබූ කාලය (මාස 03/මාස 06/අවුරුද්දක්) :..................

5. තනතුරට අදාළ වෙනත් සුදුසුකම් : ........................................................................................
........................................................................................
........................................................................................

අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මා දනිමි.

........................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ ..................................................

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ............................................ මයා/මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .............................වශයෙන් සේවය කරනු ලබයි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

........................................................
දෙපාර්තමේන්තු/ආයතන,
ප්‍රධානියාගේ බලය පවරනු ලැබූ
නිලධාරියාගේ අත්සන.

නම ඃ ......................................................
පදවි නාමය ඃ ............................................
දෙපාර්තමේන්තුව/ආයතනය නිල මුද්‍රාව යොදන්න
දිනය ඃ ..........................................................

සැ.යු.- නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අදාළ සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැරදි තොරතුරු ලබා දී පරීක්ෂණ සඳහා සහභාගී වන අයදුම්කරුවන් මින් ඉදිරියට සිදු කෙරෙන කිසිදු බඳවා ගැනීමකට සලකා නොලැබීම සඳහා අසාධු ලේඛන ගත කරනු ලැබේ.

07 - 616

# පළාත් පාලන නිවේදන

## අලව්ව ප්‍රාදේශීය සභාව

විනෝද බදු ආඥාපනත

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ 2 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ වයඹ පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී වගන්තිය අනුව මෙයින් පලකරනු ලැබේ.

**යෝජනාව**

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියෙන් 1 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභාවේ පරිපාලක සීමා ඇතුලත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුල්වීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට දහයකට (10%) සමාන බද්දක් පනවා අයකළ යුතු යැයිද, මෙම යෝජනා සම්මතය *ගැසට් පත්‍රයේ* පළකරන ලද මාසයකට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළවන දින සිට ක්‍රියාත්මක වියයුතු යයි ද යෝජනා කරන්නීය.

අධි නීතීඥ රාජා කොල්ලුරේ,
වයඹ පළාත් ගරු අණ්ඩුකාරවර,
ආණ්ඩුකාර කාර්යාලය,
මාළිගාව,
කුරුණෑගල.

07-504

---

## හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත් වලට අදාල ඉඩම් වලට අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රය* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්ති ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) වගන්තිය යටතේ උපලේඛනයේ සඳහන් මංමාවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ස්ථිර වශයෙන්ම පාලනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2021 මාර්තු මස 24 වැනි දින.

මාර්ගයේ නම - හල්ඔළුව පැනසර මාවත
ආරම්භය - හල්ඔළුව ගැටඹේ ප්‍රධාන මාර්ගය
අවසානය - යෝක් හොටෙල් පාලම

වම්පස -
1. ඩී. ජී. ජයසේකර - අංක 157/2, හල්ඔළුව
2. පී. එස්. කේ. රජපක්ෂ - අංක 161/1/11, ගන්තොටතැන්න
3. එම්. එන්. ඒ. ජයවර්ධන - අක 160/1/ඒ, හල්ඔළුව
4. ටී. ඩී. ජගත්කාන්ත - අංක 162/1/සී. හල්ඔළුව
5. ආර්. බෝවත්ත - අංක 162/1/1, හල්ඔළුව

දකුණු පස -
1. ඉන්ද්‍රාණි විජේරත්න - අංක 174/බී, හල්ඔළුව
2. චතුර මධුෂාන් - අංක 21/4, ගංතොටතැන්න, හල්ඔළුව
3. ඩී. ඒ. ඒ. කරුණාරත්න - අංක 160/1/සී, ගංතොටතැන්න
4. ඩී. ජී. නාමල් රජපක්ෂ - අංක 162, ගංතොටතැන්න, හල්ඔළුව
5. එම්. ජී. සී. මල්වත්ත - අංක 162/1/බී. ගංතොටතැන්න
6. පී. ජී. ජේම්ස් - අංක 160/1/බී, ගංතොටතැන්න
7. ජී. පී. ජී. එස්. ගුණරත්න - අංක 162/3, ගංතොටතැන්න
8. චම්පිකා ප්‍රියදර්ශනී - අංක 162/2, ගංතොටතැන්න
9. ධර්මරත්න - අංක 160/1/සී. ගංතොටතැන්න
10. කේ. විජේරත්න - අංක 162/1/ඒ, ගංතොටතැන්න
11. ඉෂාණි සිරිවර්ධන - අංක 162/6, ගංතොටතැන්න

මාර්ගයේ දිග - මීටර 96
මාර්ගයේ පළල - අඩි 20
පිඹුරු පත - මිනින්දෝරු ඒ. එම්. තිලකරත්න මහතා විසින් මැන අඳින ලද අංක 1971 දරන පිඹුරුපත

07-498

---

**උඩුනුවර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාල ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

**ලියාපදිංචි කළ යුතු මාර්ග**

මිනින්දෝරු සැලැස්ම සහිත

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග | පළල |
|---|---|---|---|---|---|---|---|---|
| 01. | අංක 63 බඹරදෙනිය | නාගොල්ලේ පාර | බඹරදෙණිය වතුපොල මාර්ගයෙන් (සී. බී. ආර්. චන්ද්‍රතිලක මහතාගේ ඉඩමෙන්) | සී. බී. ආර්. රත්නායකගේ මහතාගේ නිවස අසලින් | එම්. ටී. ඒ. එස්. සීලවංශ<br>සී. බී. ආර්. රත්නායක<br>සී. බී. ආර්. ප්‍රේමරත්න<br>සී. බී. ආර්. චන්ද්‍රතිලක | සී. බී. ආර්. සමන්ත බණ්ඩාර | මීටර් 200 | අඩි 08 |


මිනින්දෝරු සැලැස්ම රහිත

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග | පළල |
|---|---|---|---|---|---|---|---|---|
| 01. | අංක 54 අරත්තන | දෙල්ගහගොඩහේන පාර | අරත්තන ගලේකඩේ ප්‍රධාන පාරේ ගල්ළිඳ වඩිත්ත ළිඳ | එච්. එම්. බණ්ඩාරනායක යන අයගේ නිවස | | ජී. එම්. හීන්බණ්ඩා<br>ජී. එම්. ඉන්ද්‍රානි<br>ගුණරත්න<br>පූජ්‍ය බෝවල විමලතිස්ස හිමි | අඩි 450 | අඩි 08 |

**Anura .W. Gunasekara**
Registered Surveyor,
Reg.No:19960828
Kegalla

PLAN No: 1003

EXTRACT OFLOT 5




SCALE 1 : 1000

PLAN

of

Divided portio of lands called

Gongallegedarawatta (showing Access )

Situated at Bambaradeniya in

Udunuwara -Meda Paltha

Gramasewa Division Bambaradeniya

AGA's Division -Udunuwara-Pradesiya Sabawa

**KANDY DISTRICT CENTRAL PROVINCE**

Containing Extent

| LOT NO: | A. | R. | P. | Ha: |
|---|---|---|---|---|
| 5 | 0. | 0 | 08.50 | 0.0215 |

(EXTENT)

Surveyed on : 22 .05 .2020

Anura W. Gunasekara
Hydrographic Surveyor & Reg Licensed Surveyor & Leveller
No. 122/1, Nagoda Road
Kegalla
Reg No 19960828

Gazette
22 JUL 2021

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG/LG - 5/5/1/22-2 හා 2021/05/13 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සලකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේ නම් මෙම දැන්වීම පල කළ දින සිට මාස 03ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,

කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

| | | |
|---|---|---|
| පාරේ නම | : | මීදෙනිය තැන්නපිට හවඩියලෑ අරඹ සහ දෙනිය මාර්ගය |
| වසම | : | 55 D මීදෙනිය දකුණ |
| මාර්ගයේ පළල | : | ලොට් අංක 01-මීටර් 3.048 (අඩි 10)<br>ලොට් අංක 02 - මීටර් 2.438 (අඩි 08) |
| මාර්ගයේ දිග | : | මීටර් 90.878 (අඩි 298.15) |

*මාර්ගයේ දකුණු පස හිමිකරුවන්*


1. ඩී. ආර්. විලී දිසානායක යන අයට අයත් ඉඩම
2. එච්. ඒ. ජී. ජේ. අජන්ත යන අයට අයත් ඉඩම
3. ඊ. ආර්. එල්. බණ්ඩාර යන අයට අයත් ඉඩම
4. ඊ. ආර්. එල්. බණ්ඩාර යන අයට අයත් කුඹුරු ඉඩම
5. ඩී. ආර්. ගාමිණී දසනායක යන අයට අයත් ඉඩම

*මාර්ගයේ වම් පස හිමිකරුවන්*

1. ජේ. ඒ. උපාලි ජයසිංහ යන අයට අයත් ඉඩම
2. ඩී. ආර්. හෙන්රි දසනායක යන අයට අයත් ඉඩම
3. ඊ. ආර්. එල්. බණ්ඩාර යන අයට අයත් ඉඩම
4. පී. කේ. ජී. ඩබ්. වීරමන් යන අයට අයත් ඉඩම
5. ඩී. ආර්. එස්. කේ. බණ්ඩාර යන අයට අයත් ඉඩම

T.B.S.Sangarandeniya
Registered Licd. Surveyor & Leveller
No. 61/A ,Weralugasanga,
Dabakotuwa,
Kengalla.

Plan No. 16122




| Reference | |
|---|---|
| St | - Stake |
| CP | - Cement Post |
| EB | - Earth Bank |
| EP | - Electric Post |
| Road(PS) | - Road (Pradeshiya Saba) |

SCALE :- 1 : 500

# PLAN

Of

Two(2) Allotments of land called ' Hawadiyalaa Armba And Deniya '
Situated In Meedeniya Village
Within 55D Meedeniya South Grama Niladari Division
In Kegalle Divisional Secretariat Area
In Mawatha Pattuwa of Paranakuru Korale

## KEGALLE DISTRICT
## SABARAGAMUWA PROVINCE

සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

| Lot No | Extent | | | Hectares | Remarks |
|---|---|---|---|---|---|
| | A | R | P | | |
| 1 | 0 | 0 | 01.79 | 0.0045 | Road ( Wide 3.048m, 10 Feet ),( Length 13.986m, 45.88 feet ) |
| 2 | 0 | 0 | 07.47 | 0.0189 | Road ( Wide 2.438m, 8 Feet), ( Length 76.892m, 252.27 feet ) |
| | 0 | 0 | 09.26 | 0.0234 | Total Distance ( 90.878m, 298.15 Feet) |

Surveyed on: 09-01-2020

Bounded as described above

T.B.S. SANGARANDENIYA
Registered Licensed Surveyor
Reg. No. 19790243

පාරේ නම : බුලත්කොහුපිටිය මාර්ගයේ පිහිටි නාරම්පිටිය වත්තට යන මාර්ගය
වසම : කවුඩුගම වසම
මාර්ගයේ දිග : මීටර් 148 (අඩි 485)
මාර්ගයේ පළල : මීටර් 2.45 (අඩි 08)

*මාර්ගයේ වම් පස හිමිකරුවන්*


1. කේ. එච්. නිමල් කුලරත්න යන අයට අයත් ඉඩම
2. කේ. චන්දන නිශාන්ත යන අයට අයත් ඉඩම
3. නිමල් කරුණාරත්න යන අයට අයත් ඉඩම

*මාර්ගයේ දකුණු පස හිමිකරුවන්*

1. එස්. පී. කුසුමාවතී යන අයට අයත් ඉඩම
2. කේ. එච්. ප්‍රේමදාස යන අයට අයත් ඉඩම
3. කේ. ඒ. ජී. නෙළුම් කුමාරි යන අයට අයත් ඉඩම
4. එච්. ආර්. විමලා ආරියවංශ යන අයට අයත් ඉඩම
5. එස්. එන්. සී. වීරසේකර යන අයට අයත් ඉඩම
6. කේ. එච්. ප්‍රේමදාස යන අයට අයත් ඉඩම

*H.M.R.T.K.HERATH*
*Licensed Surveyor Leveller &*
*Court Commissioner*
*86/04,Jayabima Mawatha*
*Daluggala,Rambukkana*
*Reg.No.19831492*

PLAN No: 770/2020




**Scale 1 : 1000**

# PLAN

**of**

**an allotment of land called Naranpitiyewatta**

**situated at**

*NARANPITIYA VILLAGE IN MAWATHA PATTUWA OF PARANAKURU KORALE IN*

*(Kaudugama Grama Niladhari's Division of Kegalle Divisional Secretary's Division and Kegalle Pradeshiya Sabha)*

## Kegalle District

## Sabaragamuwa Province

Bounded as described above.

| Lot No | Containing in Extent | | | |
|---|---|---|---|---|
| | Hectares | A | R | P |
| 1 | 0.03617 | 00 | 0 | 14.30 |

NOTE:- 1. Width of the Road 2.45m(8 Feet), Lengh of the Road 148m(485 Feet)
2. Boundaries pointed out by the owners and owners of adjoining lands.

*Surveyed on*
*29th of November in 2020.*

30-11-2020

H.M.R.T.K. HERATH
Licensed Surveyor, Leveler
Court Commissioner & Valuer,
86/04, Jayabima Mawatha,
Daluggala, Rambukkana

සැලසුම් අනුමතයි.

ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

පාරේ නම : අඹන්පිටිය නෝමන් ගුණතිලක මාවතේ සිට දඹුල්ලෑවත්ත මාර්ගය
වසම : අඹන්පිටිය වසම
මාර්ගයේ දිග : මීටර් 172
මාර්ගයේ පළල : අඩි 10

*මාර්ගයේ දකුණු පස හිමිකරුවන්*

1. ඩබ්. පියසේන යන අයට අයත් හිටිනාවත්ත ඉඩම
2. වී. ජයරත්න යන අයට අයත් හිටිනාවත්ත ඉඩම
3. එම්. පී. සී. කේ. කිනිගම යන අයට අයත් හිටිනාවත්ත ඉඩම
4. මංජුල විජේවර්ධන යන අයට අයත් හිටිනාවත්ත ඉඩම
5. බී. ජේ. එස්. විජේවර්ධන යන අයට අයත් දඹුල්ලෑවත්ත ඉඩම
6. එම්. ඒ. ඒ. ආර්. ගුණරත්න යන අයට අයත් දඹුල්ලෑවත්ත ඉඩම
7. ඩී. එම්. පී. ජී. චන්ද්‍රාවතී යන අයට අයත් දඹුල්ලෑවත්ත ඉඩම
8. ආර්. ජේ. බණ්ඩාර යන අයට අයත් දඹුල්ලෑවත්ත ඉඩම

*මාර්ගයේ වම් පස හිමිකරුවන්*

1. වී. එන්. අනුරාධ කරුණාරත්න යන අයට අයත් උඩ දඹුල්ලෑවත්ත ඉඩම
2. එච්. එම්. ඒ. කේ. වීරසූරිය යන අයට අයත් උඩ දඹුල්ලෑවත්ත ඉඩම
3. නිහාල් ප්‍රේම කුමාර යන අයට අයත් උඩ දඹුල්ලෑවත්ත ඉඩම
4. ඒ. ඩී. සී. සම්පත් යන අයට අයත් උඩ දඹුල්ලෑවත්ත ඉඩම
5. යූ. එම්. වී. එන්. කේ. අතාවුද යන අයට අයත් දඹුල්ලෑවත්ත ඉඩම

පී. ඒ. ආර්. පෙරේරා (එෆ්. එස්. අයි.)
ලියා පදිංචි බලයලත් මිනින්දෝරු,
(ලි. ප. අංකය: 19680407)
අංක 104, කොළඹ පාර,
ගලිගමුව නගරය.
ටෙලි: 035-2283322.


පිඹුරු අංකය : 3031 ඒ

සැබෑ පිටපතකි.

.......................
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

යොමුව

කපැවැ = කම්බි හා පැලඟති වැට
පැවැ = පැලඟති වැට
මාබි = මායිම් බිත්තිය
සිත = සිමෙන්ති කම්බි කනුව
ලී = ලී කනුව
අපා = අඩි පාර




සටහන: - බිම් කැබලි විස්තර ලැයිස්තුව සඳහා පසුපිට බලන්න. පාර පළල අඩි දහයයි, දිග මීටර් එකසිය හැත්තෑ දෙකයි.

පරිමාණය 1 : 1000

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළේ, උතුරු මාවත පත්තුවේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුල, අංක 52, අඹන්පිටිය ග්‍රාම නිලධාරී වසමේ, අඹන්පිටිය ගමේ නෝමන් ගුණතිලක මාවතේ සිට ආර්. ජේ. බණ්ඩාර සතු දඹුල්ලෑවත්ත දක්වා ඇති පාර මැන පෙන්නුම් කරන

– පිඹුර –

මායිම්: –

උතුරට :– නෝමන් ගුණතිලක මාවත හා නිහාල් ප්‍රේමකුමාරට අයිති උඩදඹුල්ලෑවත්ත
නැගෙනහිරට :– වී. එන්. අනුරුද්ධ කරුණාරත්න, එච්. එම්. ඒ. එම්. කේ. වීරසූරිය හා නිහාල් ප්‍රේමකුමාරට අයිති උඩදඹුල්ලෑ-වත්ත, සහ ඒ. ඩී. සී. සම්පත්ට අයිති උත්තුවෑවත්ත හෙවත් දඹුල්ලෑවත්ත
දකුණට :– අඩි පාර, යූ. එම්. වී. එන්. කේ. අතාවුද හා බී. පී. එස්. විජේවර්ධනට අයිති දඹුල්ලෑවත්ත
බස්නාහිරට :– ආර්. ජේ. බණ්ඩාර, ඩී. එම්. පී. පී. චන්ද්‍රාවති, එම්. ඒ. ඒ. ආර්. ගුණරත්න හා බී. පී. එස්. විජේවර්ධනට අයිති දඹුල්ලෑවත්ත, පාර, මංජුල විජේවර්ධන, එම්. පී. සී. තිණ්ගම, වී. ජයරත්න, හා ඩබ්ලිව්. පියසේනට අයිති හිටිනාවත්ත

බිම් ප්‍රමාණය :– හෙක්ටාර් 0.05569 (හෙක්ටාර් දශම බිංදුවයි පහයි පහයි හයයි නමයත් පමණයි)
(අ. 0, රූ. 0, ප. 22.03)

මනින ලද දිනයන්: – 2006.07.08 හා 2016.07.10.

2016.07.19.
ලියා පදිංචි බලයලත් මිනින්දෝරු තැන.

පී. ඒ. ආර්. පෙරේරා,
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
ලි. ප. අංකය. 19680407
104, කොළඹ පාර,
ගලිගමුව නගරය

SISL Membership No. 0760

## බිම් කැබලි විස්තර ලැයිස්තුව

| බිම් කැබලි අංකය | බිම් ප්‍රමාණය | | | | විස්තරය |
|---|---|---|---|---|---|
| | හෙක්ටාර් | අ. | රූ. | ප. | |
| 1 | 0.00452 | 0 | 0 | 01.80 | අඩි දහයේ පාර. දිග මීටර් 14යි. (මගේ අංක 337වී දරණ පිඹුරේ බිම් කැබලි අංක 1වී) |
| 2 | 0.00498 | 0 | 0 | 01.98 | අඩි දහයේ පාර. දිග මීටර් 17 යි. (මගේ අංක 337වී දරණ පිඹුරේ බිම් කැබලි අංක 1බී සහ මගේ අංක2365වී දරණ පිඹුරේ බිම් කැබලි අංක 1) |
| 3 | 0.01092 | 0 | 0 | 04.32 | අඩි දහයේ පාර. දිග මීටර් 38 යි. (මගේ අංක 337වී දරණ පිඹුරේ බිම් කැබලි අංක 2වී සහ මගේ අංක 2365වී දරණ පිඹුරේ බිම් කැබලි අංක 2 ) |
| 4 | 0.01077 | 0 | 0 | 04.26 | අඩි දහයේ පාර. දිග මීටර් 34 යි. (මගේ අංක 337වී දරණ පිඹුරේ බිම් කැබලි අංක 2බී සහ මගේ අංක 2365වී දරණ පිඹුරේ බිම් කැබලි අංක 3 ) |
| 5 | 0.02450 | 0 | 0 | 09.67 | අඩි දහයේ පාර. දිග මීටර් 69 යි. (මගේ අංක 2365 දරණ පිඹුරේ බිම් කැබලි අංක 2 සහ බලයලත් මිනින්දෝරු, එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ අංක 2832 පිඹුරේ බිම් කැබලි අංක 1කේ කොටසත් හා අංක2832වී දරණ පිඹුරේ බිම් කැබලි අංක 4 ද ඇතුලත්වේ. |
| එකතුව | 0.05569 | 0 | 0 | 22.03 | මුලු දිග මීටර් 172 යි. |

2016.07.19

ජී. ඒ. ආර්. පෙරේරා.
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු,
ලි. ප. අංකය. 19680407
104, කොළඹ පාර,
ගලිගමුව නගරය.
ටෙලි 035 - 2283322

සැබෑ පිටපතකි.

ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

| | | |
|---|---|---|
| පාරේ නම | : | උඹරාවුල්ල යටවල ජයමාවත |
| වසම | : | 52බී උඹරාවුල්ල වසම |
| මාර්ගයේ දිග | : | මීටර් 66 |
| මාර්ගයේ පළල | : | 1 කොටස - අඩි 08<br>2 කොටස - අඩි 10 |

මාර්ගයේ දකුණු පස හිමිකරුවන්

1. කේ. ජී. ජයතිලක යන අයට අයත් ඇතිලියැද්ද ඉඩම
2. එච්. පී. සෝමසිරි යන අයට අයත් ඇතිලියැද්ද ඉඩම

මාර්ගයේ වම් පස හිමිකරුවන්


1. ජී. ආර්. ඇල්බට් යන අයට අයත් ඇතිලියැද්ද ඉඩම
2. ඩබ්. ජී. අජිත් රෝහණ කුමාර යන අයට අයත් ඇතිලියැද්ද ඉඩම
3. එච්. ඒ. සිමියොන් යන අයට අයත් මැදිකැලේ ඉඩම
4. එච්. ඒ. ප්‍රේමරත්න යන අයට අයත් මැදිකැලේ ඉඩම

(8)

ආර්.ඩී. ධර්මසේන
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
සහ තක්සේරුකරු
7/7, උසාවිය පාර
කෑගල්ල.
මි.ප. අංකය 1989 1716
දු.අංකය 0718142729

පිඹුරු අංකය 764






සැබෑ පිටපතකි.

ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

යොමුව

| | |
|---|---|
| ක | මායිම් කණුව |
| වික | විදුලි කණුව |
| ඉ | ඉවුර |
| පැවු | පැලුඹුණි වැට |
| කවු | කම්බි වැට |
| ආතා | ආධාරක තාප්පය |
| මාර්ග(ප්‍රාස) | මාර්ගය(ප්‍රාදේශීය සභා) |

පරිමාණය 1: 1000

සබරගමුව පළාතේ

කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ මාවත පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය සභාව තුළ

අංක 52 B ඌරාළුල්ල ග්‍රාම නිළධාරී කොට්ඨාශය තුළ යටවල ගමේ පිහිටි "ජයමාවත"

කැබැලි දෙකකට(2) වෙන්කර මැන දැක්වෙන

— පිඹුර —

කැබැලි අංක 1 - මධ්‍ය රේඛාවේ දිග - මීටර් 20.0, පළල මීටර් 2.43 (අඩි 8), බිම් ප්‍රමාණය හෙක්ටාර් 0.0048 (අ.0 , රූ.0, පර්. 1.9)
කැබැලි අංක 2 - මධ්‍ය රේඛාවේ දිග - මීටර් 46.0, පළල මීටර් 3.05 (අඩි 10), බිම් ප්‍රමාණය හෙක්ටාර් 0.0140 (අ.0 , රූ.0, පර්. 5.5)

මැනීම කළේ 2019.12.29

ආර්.ඩී. ධර්මසේන
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
සහ තක්සේරුකරු
2019.12.29

ආර්.ඩී. ධර්මසේන
ලියාපදිංචි මිනින්දෝරු
7/7, උසාවිය පාර,
කෑගල්ල.

# විවිධ දැන්වීම්

සංශෝධනයයි

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

2020.12.24 වැනි දින පළ වූ අංක 2,208 ගැසට් පත්‍රයේ 12-567/10 නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතුය.

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

2021 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් හා දේපල කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2021 වර්ෂයට අදාළව සපයනු ලබන සේවාවන් හා දේපල කුලියට දීම වෙනුවෙන් ගාස්තු පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බවට 2020 වර්ෂයෙහි දෙසැම්බර් මස 28 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 08 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2020 දෙසැම්බර් මස 08 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභාවෙන් සිදුකරන සේවාවන් සඳහා II වන උපලේඛනයෙහි සඳහන් ගාස්තු ද 2021 වර්ෂය සඳහා පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බවට, කුරුණෑගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

II වන උපලේඛනය

| *අනු අංකය* | *විස්තරය* | *ගෙවිය යුතු ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 15 | ඉදිකර අවසන් නේවාසික ගොඩනැගිල්ලක් සඳහා සැලසුම අනුමත කිරීමේදී දඩ මුදල් අය කිරීම<br>සැලැස්මෙ පරිදි සියලු වැඩ කොටස් අවසන්කර ඇත්නම්<br>වර්ග අඩි 0 - 1000 දක්වා | 2,000,00 |
| | වර්ග අඩි 1001 - 2000 දක්වා | 5,000.00 |
| | වර්ග අඩි 2001 - 3000 දක්වා | 10,000.00 |
| | වර්ග අඩි 3001 සිට ඉහලට | 15,000.00 |
| 16 | ඉදිකර අවසන් ව්‍යාපාරික ගොඩනැගිල්ලක් සඳහා සැලසුම අනුමත කිරීමේදී දඩ මුදල් අය කිරීම<br>සැලැස්මේ පරිදි සියලු වැඩ කොටස් අවසන්කර ඇත්නම් | |
| | වර්ග අඩි 0 - 1000 දක්වා | 10,000,00 |
| | වර්ග අඩි 1001 - 2000 දක්වා | 20,000.00 |
| | වර්ග අඩි 2001 - 3000 දක්වා | 30,000.00 |
| | වර්ග අඩි 3001 සිට ඉහලට | 50,000.00 |

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2015.08.04 දිනට පෙර ඉදිකර ඇති සියලු ඉදිකිරීම් සඳහා ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා ගත යුතු අතර එසේ අනුමැතිය නොලත් 2015.08.04 ට පෙර සිදු කරන ලද සියලු ඉදිකිරීම් සඳහා 2021 අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේදී ඉහත සඳහන් දඩ මුදල් අය කරනු ඇත. එමෙන්ම 2015.08.04 දිනට පසු ඉදිකර ඇති සියලු ඉදිකිරීම් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පනවනු ලබන සේවා ගාස්තු අදාළ වන බවත් සලකන්න.

07-670/1

---

සංශෝධනයයි

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

2020.12.24 වැනි දින පළ වූ අංක 2,208 ගැසට් පත්‍රයේ 12-567/10 නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතුය.

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

2021 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් හා දේපළ කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2021 වර්ෂයට අදාළව සපයනු ලබන සේවාවන් හා දේපළ කුලියට දීම වෙනුවෙන් ගාස්තු පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බවට 2021 වර්ෂයෙහි පෙබරවාරි මස 16 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 20 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2021 පෙබරවාරි මස 16 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභාවෙන් සිදුකරන සේවාවන් සඳහා II වන උපලේඛනයෙහි සඳහන් ගාස්තු ද 2021 වර්ෂය සඳහා නියම විය යුතු බවට, කුරුණෑගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය අංක II

| *අනු අංකය* | විස්තරය | ගෙවිය යුතු ගාස්තුව<br>රු. ශත |
|---|---|---|
| 2 | අන්තරාදායක ගස් පෝරම ගාස්තු හා පරීක්ෂණ ගාස්තු | 500.00 |

07-670/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.